11867

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

**02 S**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2569 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024 (2025)

## (02) බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

**1.** (i) පටිච්චසමුප්පාද ඉගැන්වීම මුලින්ම ශ්‍රවණය කළ බුද්ධ ශ්‍රාවකයන් දෙදෙනා නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පටිච්චසමුප්පාදයෙන් ප්‍රතික්ෂේප වන බුද්ධකාලීන භාරතයේ පැවති මතවාද හතරක් ලියන්න. (ලකුණු 04 යි)

(iii) (අ) පටිච්චසමුප්පාද න්‍යාය සංක්ෂිප්තව දක්වන වගන්ති හතරකින් යුත් පාඨය ලියා දක්වන්න.

(ආ) එම කෙටි සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(iv) ද්වාදසාංගික පටිච්චසමුප්පාදය නම් කොට එහි ධර්මාර්ථ පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**2.** (i) චතුරාර්ය සත්‍යයේ සෑම සත්‍යයකින් ම අවධානයට ලක් කෙරෙන ධර්ම සංකල්පය නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දුක්ඛසමුදය - අරියසච්ච කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) දුක්ඛසච්චයේ ඇතුළත් නොවැදෑරුම් දුක නම් කරන්න.

(ආ) "බුදුසමය දුක පිළිබඳ කරන අනාවරණය යථාර්ථවාදී වේ." පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) සාර්ථක සමාජ ජීවිතයක් ගොඩනගා ගැනීමට ආර්ය-අෂ්ටාංගික මාර්ගයේ ඇති උපයෝගිතාව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**3.** (i) තුන්දොරින් කරන ක්‍රියාවක් කර්මයක් බවට පත්වීමට අවශ්‍ය චෛතසිකය නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කර්මය විපාක දෙන ආකාර දෙකක් හඳුන්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) චුති චිත්ත සහ පටිසන්ධි චිත්ත හඳුන්වන්න.

(ආ) කර්මය මැනවින් පැහැදිලි කිරීම සඳහා ප්‍රතීත්‍යසමුත්පාදය උපයෝගී කොටගෙන ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) "කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම, සියල්ල කර්මයට භාර නොදේ" සාධක තුනක් ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න

4. (i) නිවන නොපිළිගත් බුද්ධකාලීන ඉන්දියානු සමාජයේ පැවති දෘෂ්ටි වාද දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිවන හැඳින්වීම සඳහා පාලි සාහිත්‍යයේ භාවිත වන පාලි රූප හතරක් එහි තේරුම සමග ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සෝවාන් ඵලයට පත්වන විට ප්‍රහීන වන සංයෝජන තුන නම් කරන්න.
(ආ) ඉහත 4. (iii) (අ) ට අදාළ සංයෝජන තුන කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iv) නිවන පිළිබඳ ලෞකික සහ ලෝකෝත්තර පැහැදිලි කිරීම බෞද්ධ සාහිත්‍යයේ හමුවන නිදර්ශන ඇසුරෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

## II කොටස

5. (i) සමථ භාවනාව සඳහා යෙදෙන අපර නාම දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

(ii) සමථ භාවනාවෙන් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ත්‍රිලක්ෂණය හා විදර්ශනා භාවනාව අතර ඇති සම්බන්ධය අනාවරණය කරන්න.
(ආ) කර්මස්ථාන ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු චරිත විභාගය හෙළි කරන්න. (ලකුණු 06 යි)

(iv) බෞද්ධ භාවනාව සාර්ථක ජීවිතයකට ඉවහල් වන ආකාරය ඔබ කැමති සමථ කර්මස්ථාන දෙකක් ඇසුරෙන් ප්‍රකට කරන්න. (ලකුණු 08 යි)

6. (i) අභිධර්මයේ ඉගැන්වෙන සත්‍යද්වය ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) සතර පරමාර්ථ ධර්ම නම් කොට ඒවා සංඛත-අසංඛත වශයෙන් බෙදා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) අසූනව වැදෑරුම් චිත්ත වර්ගීකරණයේ ප්‍රධාන ප්‍රභේද හතර ගෙනහැර දක්වන්න.
(ආ) සිත්වල පවත්නා කර්ම, විපාක සහ ක්‍රියා භේද පහදන්න. (ලකුණු 06 යි)

(iv) සිතේ ස්වභාවය හැදෑරීමේ දී චෛතසිකවල උපයෝගිතාව අකුසල චෛතසික ඇසුරෙන් අනාවරණය කරන්න. (ලකුණු 08 යි)

7. (i) මනෝවිඥානයට ආශ්‍රය වන වස්තු-රූපය නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) චෛතසිකවල ප්‍රධාන ලක්ෂණ හතර ලියන්න. (ලකුණු 04 යි)

(iii) (අ) අඤ්ඤසමාන චෛතසික එම නමින් හැඳින්වීමේ හේතුව ලියා දක්වන්න.
(ආ) සබ්බචිත්තසාධාරණ චෛතසික පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ලකුණු 06 යි)

(iv) ඔබ කැමති අකුසල චෛතසික තුනක් නම් කොට ඒවා පුද්ගල සංවර්ධනයට හානි පමුණුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

## III කොටස

8. පහත සඳහන් ගාථා සිංහලට නගන්න.

(i) මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං - අථ බාලෝ දුක්ඛං නිගච්ඡති.

(ii) අසතං භාවනමිච්ඡෙය්‍ය - පුරෙක්ඛාරං ච භික්ඛුසු
ආවාසේසු ච ඉස්සරියං - පූජා පරකුලේසු ච.

(iii) කණ්හං ධම්මං විප්පහාය - සුක්කං භාවෙථ පණ්ඩිතෝ
ඕකා අනෝකං ආගම්ම - විවෙකේ යත්ථ දූරමං.

(iv) අග්ගි යථා පජ්ජලති - දේවතාව විරෝචති
සිරියා අජහිතෝ හෝති - යෝ මිත්තානං න දූහති.

(ලකුණු 05 × 4 = 20 යි)

9. පහත සඳහන් පාලි ගාථා සිංහලට නගන්න.

(i) අක්කුද්ධෝ සඝරං ඒති - සභාය පටිනන්දිතෝ
සඤාතීනං උත්තමෝ හෝති - යෝ මිත්තානං න දූහති.

(ii) මහාසම්පත්ති තුම්හේහි - ලද්ධායං පුඤ්ඤකම්මුනා
අප්පමාදෝව කාතබ්බෝ - පුඤ්ඤකම්මෙ ඉදානිපි.

(iii) සූරවීරෝ බලූපේතෝ - මේරුසාරෝ ගුණාකරෝ
ධීරෝ සුපතිට්ඨිතන්තෝ - පුත්තෝ තේ දේව ජායති.

(iv) ද්වත්තිංස දමිළේ හන්ත්වා - කත්වා යුද්ධං අසාදිසං
එකේ කත්වානිමං ලඞ්කං - ඒකරජ්ජං කාරෙස්සති.

(ලකුණු 05 × 4 = 20 යි)

10. පහත සඳහන් පාලි පාඨ සිංහලට නගන්න.

(i) නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති.

(ii) නහ නූන සෝ භික්ඛවෙ භික්ඛු ඉමානි චත්තාරි අහිරාජ-කුලානි මෙත්තේන චිත්තේන ඵරි.

(iii) සෝ තද හේව අජ්ජෙ ආදාය දිසවාපිතලාකේ නහාත්වා ච පිත්වා ච ගච්ඡන්තෝ සායණ්හේ මහාගාමං සම්පාපුණි.

(iv) රාජා සබ්බං තං නිමිත්තං දිස්වා තුට්ඨචිත්තෝ භික්ඛුසඞ්ඝං නිසීදාපෙත්වා පණීතේන පායාසේනේව සන්තප්පේසි.

(v) ඉමස්ස පන දෝහළස්ස දුල්ලභත්තා සා රඤ්ඤෝ අනාචික්ඛන්තී කිසා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා අහෝසි.

(ලකුණු 04 × 5 = 20 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library